# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

තරිදු ජයවර්ධන
සමාජය හා සාමයික කේන්ද්‍රය
281,
ඩීන්ස් පාර,
කොළඹ 10

අභියාචක

අභියාචනා අංකය :

**RTIC Appeal Nos. /927/2022,928/2022,929/2022** එදිරිව

ශ්‍රී ලංකා පොලීසිය
පොලිස් මූලස්ථානය
කොළඹ 01

පොදු අධිකාරිය

| | | | |
|---|---|---|---|
| ඉදිරිපිටදී | : | 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) | - සභාපති |
| | | 2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) | - කොමසාරිස් |
| | | 3. නීතිඥ කිශාලි පින්ටෝ ජයවර්ධන | - කොමසාරිස් |
| | | 4. නීතිඥ ජගත් ලියන ආරච්චි | - කොමසාරිස් |

**පෙනී සිටීම** : අභියාචක සිටී. අභියාචක වෙනුවෙන් නීතිඥ සුරේන් ඩී. පෙරේරා මයා සහ නීතිඥ මනුෂිකා කුරේ මිය පෙනී සිටී.
පොදු අධිකාරිය වෙනුවෙන් ප්‍රධාන පොලිස් පරීක්ෂක (නීති උපදෙස් අංශය) වසන්ත කුමාර මයා, සහකාර පොලිස් අධිකාරී (සැපයුම් අංශය) එම්.එන් හෙට්ටිආරච්චි සහ අණ දෙන නිලධාරි සී.ඩී ලියනගේ මයා පෙනී සිටී.

**දිනය** : 2022.09.14

මෙම අභියාචනා තුනට අදාළ තොරතුරු ඉල්ලීම් සම්බන්ධයෙන්, අභියාචකටද පිටපතක් සහිතව, පොදු අධිකාරියේ අධ්‍යක්ෂක (සැපයුම්) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පී.බී ජයසුන්දර මහතාගේ අත්සනින් කොමිෂන් සභාව අමතන ලද 2022.09.08 දිනැති ලිපියෙන් තොරතුරු මුදා හැරීමක් සිදු කර ඇති අතර එය පූර්ණ තොරතුරු මුදා හැරීමක් නොවන බවට අභියාචක කරුණු දක්වා ඇත. ඉහත කී දින දරණ අදාළ ලේඛනයෙන්ද ඒ බව පැහැදිලි වේ.

පොදු අධිකාරියේ අද දින විමසීමට සහභාගි වන නිලධාරින් සඳහන් කරන අන්දමට දින 10 ක පමණ කාල සීමාවකදී ප්‍රතිචාර දැක්විය හැකි බවට සඳහන් කරයි. ඒ අනුව මෙම අභියාචනය විමසීම එකී ප්‍රතිචාරයෙන් පසුව සිදු කිරීමට විමසීම ඉදිරි දිනට කල් තබමු.

විමසීම 2022.10.06 දින ප.ව 3.15 ට.

*සටහන් ගැනීම ඔෂයි අදිකාරම විසිනි.*